# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/2 - 2013 මාර්තු මස 18 වැනි සඳුදා - 2013.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අළුත්ගමගේ වන මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(1) වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් නියෝග නියම කරමි.

(1) දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2012 වර්ෂය සඳහා නිළවරණයෙන් පත්ව ඇති විධායක සභාවේ නිළධාරීන්ගේ නිල කාලය 2013 අප්‍රේල් මස 16 වැනි දිනතෙක් බලපැවැත්වෙන පරිදි දීර්ඝ කිරීමට නියම කරමි.

(2) 2013 මාර්තු මස 30 වැනි දිනට කැඳවා තිබූ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2013/2014 වසර සඳහා නිලධාරී තෝරා ගැනීම සඳහා වූ නිළවරණයේ මහා සභා රැස්වීම හා නිළවරණය 2013 අප්‍රේල් මස 16 වන දිනට කල් තැබීමට මෙයින් නියම කරමි.

මහින්දානන්ද අළුත්ගමගේ,
ක්‍රීඩා අමාත්‍ය.

2013 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

04 - 05

1A - G 017440 — 340 (2013/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*